Law & Society Trust

HRiC | Newsletter

ISSUE 1, JANUARY/APRIL, 2014

## යාපනය, කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය



යාපනය හා කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය තුළින් මුදුන් පමුණුවා ගැනීමට බලාපොරොත්තු වන අරමුණු වශයෙන්, යාපනය අර්ධද්වීපයෙහි පවතින ප්‍රදේශ වල සෞඛ්‍යය හා මානව සංවර්ධනය වැඩි දියුණු කිරීම හැඳින්විය හැකිය. මෙම ව්‍යාපෘතිය මඟින් යුද්ධයෙන් බලපෑම් සිදු වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා දායකත්වය සපයනු ලබයි.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, 300,000 කට ආසන්න ජනතාව හට පිරිසිදු ජලය ලබා දීම හා 80,000 ක් පමණ පිරිසක් හට සනීපාරක්ෂක පහසුකම් සපයා දීමයි. ව්‍යාපෘතිය මඟින් යාපනය, කොඩිකාමම්, කරවේඩි, චාවකච්චේරි, නවට්කුලි, කෝපෙයි, අච්චුවේලි, සන්දිලිපෙයි, කඩ්ඩුඩෙයි, නවලි, චෙන්ගනෙයි, නල්ලූර්, මූලෙයි, අරලි, වඩ්ඩුකොඩ්ඩයි, කරෙයිනගර්, කයිට්ස්, අනලෙතිවු, පුන්කුඩිතිවු, වෙලනෙයි, මන්ඩෙතිවු, පූනකරි සහ පලෙයි ආදී නගර හා උපනගර වල ජීවත් වන ජනතාව හට ප්‍රතිලාභ සැලසීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය තුළින් තවදුරටත් ව්‍යාපෘතියට සම්බන්ධිත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (NWSDB) මූල්‍යමය හා ආයතනික ස්ථාවරත්වය සහ පළාත් සභා, ප්‍රාදේශීය සභා, සහ ප්‍රජා මූලික සංවිධාන (CBO) වල ආයතනික ශක්‍යතාව ඉහළ නැංවීමට කටයුතු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතියෙන් ඉහත අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ කාර්යය ඉරණමඩු ජලාශය පුනරුත්ථාපනය කිරීම හා එහි ප්‍රමුඛ කාර්යයන් වැඩි දියුණු කිරීම ආදිය තුළින් සැලසුම් කොට ඇත. ජල සම්පත් හා ජලාශයේ කාර්යක්ෂමතා මට්ටම් ඉහළ දැමීමට; ජල ආදාන පද්ධතියක්, අමිශ්‍ර ජල සැපයුම් ක්‍රමයක්, ජල ප්‍රතිකාරක යන්ත්‍රෝපකරණ ඉදි කිරීම, සහ පිරිසිදු කරන ලද ජලය පොම්ප කිරීමේ ස්ථානයක්, මෙන්ම පිරිසිදු කරන ලද ජලය සම්ප්‍රේෂණ කිරීමේ ජවමූලික යාපනය නගරසභාවේ පිහිටුවීම; මෙන්ම පිරිසිදු කරන ලද ජල සම්ප්‍රේෂණ ජවමූලිකයෙන් බෙදී ගිය බෙදුම් 12 කින් යුක්ත අතර මඟදී යාපනයට සම්බන්ධ වන ජල සැපයුම් නගර සභා හා ප්‍රාදේශීය සභා වලට ලබා දීම ආදිය තුළින් එම අරමුණු මුදුන්පත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි.[1]

ව්‍යාපෘතියේ මුළු ආයෝජන මුදල ලෙස තක්සේරු කර ඇත්තේ රුපියල් මිලියන 17,880 (ඇ.ඩො.මි. 164.4) කි. මෙයට ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) දායකත්වය සමඟ ආසියානු සංවර්ධන අරමුදල (ADF) මඟින් සපයන ලද ණය මුදල වන රුපියල් මිලියන 7,630 (ඇ.ඩො.මි. 70) ද, ව්‍යවහාර ප්‍රාග්ධන සම්පත් (OCR) මඟින් සපයන ලද ණය මුදල වන රුපියල් මිලියන 2,180 (ඇ.ඩො.මි. 20) ක මුදල් ද ඇතුළත් වේ. එලෙසම ප්‍රංශ සංවර්ධන ඒජන්සිය (Agence Francaise de Development (AFD)) විසින් රුපියල් මිලියන 5,232 (යූරෝ මිලියන හෝ ඇ.ඩො.මි. 48) ක මුදලක් ණය වශයෙන් ලබා දීමට එකඟ වී ඇත. ඒ ව්‍යාපෘතියේ ජල සම්පාදන අනු කොටස් වල එක් කොටසක් සඳහා මුදල් සැපයීම හා ව්‍යාපෘතියේ නිමැවුම් හා අධීක්ෂණ කර්තව්‍යයන් සඳහා උපදේශන සේවාවන් තුළින් සම්බන්ධ වීමෙනි.

මීට අමතරව, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) විසින්, ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ජලය අදින ලද ඉරණමඩු ජලාශයේ යටි හොය සංවර්ධන කටයුතු සිදු කිරීමට රුපියල් මිලියන 2,180 (ඇ.ඩො.මි. 20) ක් ණය වශයෙන් ලබා දීමට එකඟ වී ඇත. එමඟින් සිය වාරිමාර්ග කටයුතු සඳහා යටි හොය භාවිතා කරනු ලබන ගොවීන් හට ප්‍රමාණවත් ජල සැපයුමක් ඇති කිරීම තහවුරු කරනු ඇත.[2]

එහෙත් මෙම ගැටළුවෙහි දෙපැත්තක් ඇත. කිලිනොච්චියේ සිටින ගොවීන් මෙම ව්‍යාපෘතිය තුළින් සිය කුඹුරු වලට අත්‍යවශ්‍ය ජල සම්පාදන මාර්ග යාපනය අර්ධද්වීපයට ගෙන යනු ඇතැයි බියෙන් පසු වීම මෙහි පළමුවැන්නයි. ඉරණමඩු ව්‍යාපෘතියේ ගොවි සංගමයේ සභාපති එස්. සිවප්‍රගාසම් පවසනුයේ කිලිනොච්චිය ගොවි ප්‍රජාව හට මෙම ජල සම්පාදන ව්‍යාපෘතිය අහිතකර ලෙස බලපැවැත්විය හැකි බවයි.[3] පවතින අවිනිශ්චිත වැසි රටාවන් හා දැනට පවතින අඩු ජල මට්ටම් හේතු කොට ගෙන ගොවීන් තුළ පවත්නාවූ මෙම බිය අරුමයක් නොවේ.[4] මේ හේතුව නිසාවෙන්ම ද්‍රවිඩ ජාතික සන්ධානය විසින් මෙම ව්‍යාපෘතියට හරස් වී ඇති අතර, ඔවුන් පවසනුයේ යාපනයට ජල මාර්ගය සම්බන්ධ කිරීමට මත්තෙන් පළමුවෙන් සිඳු කළ යුත්තේ කිලිනොච්චියේ වෙසෙන ජනතාවගේ ජල හා වාරිමාර්ග (ජල සම්පාදන) අවශ්‍යතාවන් වෙත අවධානය යොමු කළ යුතු

[1] http://www.jkwssp.org/index.php/project-details

[2] http://www.development.lk/project_detail-1a--53.html

[3] http://www.colombopage.com/archive_14A/Mar05_1394034876JV.php

[4] http://www.ceylontoday.lk/90-56523-news-detail-extension-of-mahaweli-to-kilinochchi-tamils-fear-racial-colonization.html

බවයි.[5] ව්‍යාපෘතිය මඟින් ඉලක්කගත කරනුයේ යාපනය අර්ධද්වීපයට අවශ්‍ය පිරිසිදු ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීමයි. එහෙත් මෙම ඉලක්කයන් සපුරා ගැනීම උදෙසා සිදු කරනු ලබන ඉරණමඩු ජලාශය පුළුල් කිරීම මෙන්ම කාන්දු වීම් වැළැක්වීමට සිඳු කරනු ලබන ඉඳි කිරීම් ආදිය තුළින් අපේක්ෂිත අන්දමෙන්ම කිලිනොච්චියේ වාරිමාර්ග වලට වැඩි ජල සැපයුමක් ලඟා කර දෙනු ඇත. කිලිනොච්චි ගොවි ජනතාව හට ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රශ්න පැන නැඟීමට නීතිමය වශයෙන් හේතු කාරණා පවතින අතරතුරේදී, දේශපාලනික බලවේගයන් වෙනත් ආකාරයේ කාරණාවන් පිළිබඳව සැලකිල්ලක් දක්වන බව පෙනී යයි.

මෙම ව්‍යාපෘතිය හා සමඟ පවතින දේශපාලනික ගැටළුවක් වශයෙන් දේශපාලනඥයන් විසින් වැඩි අවධානයට ලක් කරන කරුණ වනුයේ, වියළි කලාප මහවැලි ව්‍යාපෘතියේ සිදු වූවා මෙන් මෙම ව්‍යාපෘතිය මඟින් කිලිනොච්චි ප්‍රදේශය තුළද වාර්ගික ජනාවාසකරණයකට මඟපාදනු ඇතැයි යන්නයි. වියළි කලාපයේ මහවැලි ව්‍යාපෘතියේදී සිදු වූවා මෙන් යාපනය කිලිනොච්චිය ව්‍යාපෘතිය වාර්ගික භාෂා හා ජනාවාසකරණය සම්බන්ධ කොට ගෙන ඇති නොවූවත්, මෑත කාලීන වාරිමාර්ග ව්‍යාපෘතිය කෙරෙහි දමිළ ජනතාව තුළ ඉහත පූර්වාදර්ශයන් කරණ කොට ගෙන ඇති කරනු ලබන මෙම බිය ඉතා සාධාරණය. රජයේ ප්‍රධාන අමාත්‍ය හා ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා 2014 මාර්තු 4 වන දින පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශය කරන ලද්දේ, රජයේ ඉරණමඩු යාපනය ජල ව්‍යාපෘතිය කිසිදු ආකාරයකින් ඉරණමඩු හෝ යාපනය ප්‍රදේශ වල සිංහල ජනතාව පදිංචි කරලීමේ අරමුණක් පෙරදැරි කරගෙන සැලසුම් කර නොමැති බවය.[6] මේ පිළිබඳව පුනආරක්ෂණය කරනු ලැබුවත්, ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ව්‍යාපෘති පිළිබඳ ඉතිහාසය එතරම් සෑහීමකට පත් විය හැකි එකක් නොවන බැවින් යාපනය හා කිලිනොච්චිය ජල ව්‍යාපෘතිය පිළිබඳව කතා කිරීමේදී ඒ පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතුය.

දැනට පවතින තත්ත්වය වනුයේ යාපනය කිලිනොච්චිය ජල ව්‍යාපෘතිය මඟින් සුදුසු යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම තුළින් යාපනයේ සිටින ජනතාව හට අවශ්‍ය පිරිසිදු ජල හා සනීපාරක්ෂක පහසුකම් සේවා සැපයීමයි. මෙය සංවර්ධනයේ ඉතා විශාල ඉදිරි පියවරක් වන අතර දශක ගණනාවක යුද්ධයකට පසුව යාපනය අර්ධද්වීපය නූතන සියවස වෙත කැඳවා ගෙන ඒමක්ද වේ. මතු පිටින් පෙනෙන අන්දමින් මෙම ව්‍යාපෘතිය ප්‍රශ්න වලින් තොර වූවකි. එහෙත් කිලිනොච්චි ගොවි ජනතාවගේ අදහස් හා වියළි කලාප මහවැලි ජල ව්‍යාපෘතියේ පූර්වාදර්ශයන් අනුව, සැබැවින්ම මෙහි ගැබ්ව පවතින ගැටළු සහගත තත්ත්වයන් පිළිබඳව රජය හා ද්‍රවිඩ ජාතික සන්ධානය යන දෙපාර්ශ්වය විසින් රාජ්‍යතාන්ත්‍රික අන්දමෙන් කරුණු සැලකිල්ලට ගත යුතුය. උතුරේ ජනගහණය අනුව මෙම ජල අර්බුදය සම්බන්ධයෙන් කිලිනොච්චිය සහ යාපනය අතර ගිවිසුමක් පැවතිය යුත්තා සේම, මෙම ව්‍යාපෘතියෙන් සෘජුවම ප්‍රතිලාභ අත් කර ගන්නාවූ ද්‍රවිඩ ජාතික සන්ධානය හා ශ්‍රී ලංකා රජය අතරද මේ පිළිබඳව අවබෝධතාවක් පැවතිය යුතුය.

ගැටුම් තුළ මානව හිමිකම් **(HRiC)** කණ්ඩායම

## කරදර ගෙන දෙන කරදිය : පෝක් සමුද්‍ර සන්ධියෙහි මසුන් ඇල්ලීම පිළිබඳව ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින අර්බුදය

වර්තමානයේ උද්ගතව ඇති තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින ධීවර ගැටළුව ප්‍රමුඛස්ථානයට පත්ව ඇත. මෙය බ්‍රිතාන්‍ය පාලනයට යටත්ව සිටි සමයේදී පවා පැවති දෙරට අතර පවතින දැවෙන ප්‍රශ්නයකි. පෝක් සමුද්‍ර සන්ධිය හරහා දෙරට අතර දේශ සීමාවන් පිළිබඳව ගිවිසුම් ඇති කර ගැනීමේදී පවා, දෙපාර්ශ්වයේම ධීවරයන් හට මුහුණ පෑමට සිදු වන අත් අඩංගුවට ගැනීම් හා මරණ ආදිය ඉදිරියට පවතින හා බරපතල ලෙස සැලකිල්ලට ලක් කළ යුතු කරුණු වශයෙන් පිළිගන්නා ලදී.

ගැටළුව උත්සන්න වූයේ ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන දෙපාර්ශ්වයම සිය මුහුදු සීමා වලට පැමිණි ධීවරයන් අත් අඩංගුවට ගැනීමට පටන් ගත් පසුවය. එලෙසම පාලන අතිවැසුම් (අධිකරණ සීමාවන් ඉක්මවා යාම) තුළ පැහැදිලි අන්දමෙන් මුහුදු සීමාවන් පිළිබඳ සීමාංකනයක් නොමැති වීම හේතුවෙන් මුහුදු සීමා උල්ලංගණය කිරීම තව තවත් පහසු වී ඇත. ශ්‍රී ලංකා නාවික හමුදාව පවසනුයේ ඉන්දීය ධීවරයන් අත් අඩංගුවට ගැනීමට ඇති එකම හේතුව ඔවුන් ශ්‍රී ලංකා මුහුදු සීමා උල්ලංගණය කිරීම පමණක්ම නොව, එහෙත් ඔවුන්ගේ මසුන් මැරීමේ විධි ක්‍රම (උපක්‍රම) නිසාවෙන් ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපයට බරපතල ලෙස හානි සිදු වීමත් සාධකයක් බවයි. ශ්‍රී ලංකාව තුළ තහනම් කරන ලද එහෙත් ඉන්දියාවේ භාවිතා පන්න ක්‍රමයක් වන බොටම් ට්‍රෝලිං (මුහුදු පතුලටම දැල් දමා මසුන් ඇල්ලීමේ ක්‍රමයකි - bottom trawling) නම් වූ පන්න ක්‍රමය තමිල්නාඩු ධීවරයන් විසින් භාවිතා කරනු ලබයි. මේ ආකාරයෙන් මසුන් ඇල්ලීම සඳහා මුහුදු පතුලට දැලක් දමා එය ඇදගෙන යනු ලබන අතර එමඟින් ශ්‍රී ලංකාවේ කොරල් පරයන් පහසුවෙන්ම විනාශයේ මුඛයට ඇදෙනු ඇත. ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න මහතා පවසනුයේ, "මෙම මසුන් ඇල්ලීමේ පන්න ක්‍රමය නිසාවෙන් ශ්‍රී ලංකාවේ උතුරු මුහුදු පත්ල හා සමුද්‍රීය පරිසරය මුළුමනින්ම විනාශයට පත් වන අතර අනාගතයේදී උතුරු මුහුදෙහි කිසිදු මත්ස්‍ය සම්පතක් ඉතිරි නොවනු ඇත" වශයෙනි.[7] ඉන්දීය ධීවරයන් පවසනුයේ ඔවුන් දන්න දා පටන් මෙම සාගරය එහි පැවති බව හා කිසිදු සීමාංකනයක් නොමැතිව ඔවුන් ශ්‍රී ලංකා මුහුදු සීමාවන් උල්ලංඝනය කළ බව පැවසීම අපහසු බවයි.

---

5 http://www.thesundayleader.lk/2013/12/22/tug-of-war-between-kilin-ochchi-and-jaffna-for-water/

6 http://www.dailynews.lk/?q=political/jaffna-kilinochchi-water-supply-scheme-will-enhance-well-being-jaffna-people-dinesh

7 http://lens.blogs.nytimes.com/2014/07/16/fishing-in-south-indias-troubled-waters/



වර්තමානයේ සිදු වූ විවිධ ක්‍රියාකාරකම් නැවත වතාවක් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතරට මෙය ගැටළුවක් ලෙස ගෙනවිත් ඇත. ගණන් බලා ඇති අන්දමට 2014 මුල් මාස 6 ඇතුළත ශ්‍රී ලංකාවේ අධිකාරයන් විසින් ඉන්දීය ධීවරයන් 200 දෙනෙක් පමණ අත් අඩංගුවට ගෙන ඇත.[8] කෙසේ නමුත් මාර්තු 28 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ඉන්දීය රජය ශ්‍රී ලංකාවට විරුද්ධව ඡන්දය දීමෙන් වැළකී සිටීමට කෘතගුණ සැලකීමක් වශයෙන් අත් අඩංගුවේ සිටි සියළුම ඉන්දීය ධිවරයින් නිදහස් කිරීමට ජනාධිපති මහින්ද රාජපක්ෂයන් විසින් නියෝග දීමේ හේතුව නිසාවෙන් මෙම සංඛ්‍යාව අඩු විය.[9] මෙහි ඇතැම් ධනාත්මක ක්‍රියාවන් සිඳු කරනු දක්නට ලැබුණත්, මෑතකදී එනම් ජූලි 16 වන දින, ශ්‍රී ලංකාවේ නාවික හමුදාව විසින් පෝක් සමුද්‍ර සන්ධිය ආසන්නයේ ධීවර ක්‍රියාකාරකම් වල යෙදී සිටී ජගතපට්ටිනම් හා රාමේශ්වරම් යන ප්‍රදේශ වල ධීවරයින් 39 දෙනෙක් අත් අඩංගුවට ගෙන ඇති බව ඉන්දීය ධීවර දෙපාර්තමේන්තු නිළධාරියෙක් විසින් පැවසූ[10] අතර, ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ප්‍රකාශ කරනු ලැබූයේ අධිකරණ ක්‍රියාමාර්ගයන්ගෙන් පසුව විශාල දඩ මුදලකට යටත්ව ජූලි 12 වන දින ශ්‍රී ලාංකීය ධිවරයන් 41 දෙනෙකු නිදහස් කරන ලද බවයි.[11]

මෙම මසුන් මැරීමේ (ධීවර) අයිතීන් පිළිබඳ ගැටළුව 1982 සාගර නීතියෙන් පැනනැගුණි. එමඟින් 1982 සාගර නීතියට අදාළව පවතින මත්ස්‍ය සම්පත්ද ඇතුළුව අදාළ සාගරයට හිමිකාරිත්වය පවතින රටට එහි ස්වාභාවික සම්පත් පිළිබඳව සුවිශේෂි අයිතියක් ලබා දෙන අතර, අදාළ රටට එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ ප්‍රඥප්තියේ අඩංගු මත්ස්‍යය සම්පත්ද ඇතුළුව සිය ස්වාභාවික සම්පත් කෙරෙහි ද සුවිශේෂි අයිතියක් ලබා දෙයි. මෙම අයිතීන් වෙරළාන්තයේ සිට නාවුක සැතපුම් 200 ක් (නාවුක සැතපුම් 1 = සැතපුම් 1.151) දුරින් පිහිටි සුවිශේෂි ආර්ථික කලාපය හා වෙරළාන්තයේ සිට නාවුක සැතපුම් 12 ක් දක්වා දීර්ඝ කරමින් දේශීය සාගරය පිළිබඳ නීතිමය අයිතීන් ලබා දෙයි. රාමේෂ්වරම් සහ මන්නාරම ප්‍රදේශ සැතපුම් 15 ක් පමණ ඈතින් පිහිටීම සහ ඉන්දියානු වෙරළ ඉම සහ යාපනය ආසන්නයේ පිහිටි දූපත් කිලෝමීටර් 48 ක් පමණ දුරස්ව පිහිටීම නිසාවෙන් සුවිශේෂී ආර්ථික කලාප හා ඉන්දියාව හා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සීමාවන් එක පිට එක වැටී (උපරිපතනය) ඇත. මෙවන් තත්ත්වයක් තුළ, සාගර නීතියෙන් පවසනුයේ, රටවල් දෙක අතර නිරන්තරයෙන් මධ්‍යස්ථභාවයක් ගන්නා සීමාංකනයන් පිළිබඳව රටවල් දෙකම පොදු එකඟතාවයකට පැමිණිය යුතු බවය.[12] මෙම උපරිපතනයන් නිසාවෙන්ම ශ්‍රී ලංකාව හා ඉන්දියාව එක්ව 1974 දී "ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ඓතිහාසික දියඹ හා ඒ හා සම්බන්ධ ගැටළු පිළිබඳ අන්තර්ජාතික සමුද්‍රීය සීමාවන් පිළිබඳ ගිවිසුම" ඇති කර ගන්නා ලද අතර එමඟින් ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර මායිමක් (මුහුදු සීමාවක්) ඇති කරන ලදී.[13] ගිවිසුමෙන් මායිම් ඇති කිරීමට රටවල් දෙක අතර ස්ථාන හයක් ලබා දෙයි, එහෙත් බොහෝමයක් ධීවර බෝට්ටු වලට ජී.පී.එස්. (GPS) උපාංග වල හිඟකම මෙන්ම මායිම් වල සීමාංකනයන් නොමැති වීම නිසාවෙන් මෙය ඉන්දියාවේ මෙන්ම ශ්‍රී ලංකාවේ ධීවරයන් විසින් කිහිප වතාවක්ම ප්‍රතික්ෂේප කරන ලදී. මෙම ගිවිසුමට අමතරව මෑත කාලීනව ඉන්දියාවේ ඩී.එම්.කේ. (DMK) පක්ෂ සභාපති කරුණානිධි ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී. එය ගොනු කර ඇත්තේ ඓතිහාසික ලියකියවිලි හා වාර්තාවන්ට අනූව 1974 ගිවිසුම ඇති කර ගන්නා විට මෙම කොදෙව්ව පිළිබඳව

[8] http://www.aljazeera.com/indepth/features/2014/06/fishing-issue-clouds-india-sri-lanka-ties-2014691244367569.html

[9] http://www.thehindu.com/news/international/south-asia/sri-lanka-to-release-all-indian-fishermen/article5843098.ece

[10] http://www.newindianexpress.com/nation/2014/07/16/39-Fishermen-Arrested-by-Sri-Lankan-Navy/article2333644.ece

[11] http://www.nation.lk/edition/breaking-news/item/31150-sri-lankan-fishermen-fined-by-indian-court.html#sthash.7fV2NeyJ.dpuf

[12] http://www.humanrights.asia/news/ahrc-news/AHRC-ART-130-2013

[13] For the full agreement see: http://www.un.org/depts/los/LEGISLATIONANDTREATIES/PDFFILES/TREATIES/LKA-IND1974BW.PDF

ඉන්දියාවට පවතින්නාවූ ස්වාධිපත්‍යය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොමැති වීම මත පදනම්වයි. ඔහු පවසනුයේ ව්‍යාවස්ථාවේ විධි නියෝගය පිට ලත් ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට අපොහොසත් වීම ගිවිසුම නිෂ්ප්‍රභා කිරීමක් බවයි, එම නීතිමය හෝ ව්‍යාවස්ථානුකූල හෝ නොවන බවයි. "මෙවන් ව්‍යාවස්ථානුකූල නොවන (අසංස්ථිතික) ගිවිසුමක් තුළින් කච්චතිවුහි තත්ත්වය ආරක්ෂා කළ නොහැකි සේම දූපත ශ්‍රී ලංකාවට පවරා දීමත් කළ නොහැකිය."[14] මෙම අධිකරණ නඩුවට ප්‍රතිචාර වශයෙන් එවකට ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යවරයාව සිටී බෝගොල්ලාගම මහතා පැවසුවේ "ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි අධිකරණ සීමාවක උසාවියක් මඟින් දෙනු ලබන තීන්දුවක් ශ්‍රී ලංකාවට බැඳීමක් නොමැත. එවන් කිසිදු අධිකරණ නියෝගයක් හෝ තීන්දුවක් මඟින් ස්වාධීන රාජ්‍යයන් දෙකක් අතර පවතින ද්වීපාර්ශ්වික ගිවිසුමක් අවසන් නොවනු ඇත."[15] මෙම 1974 ගිවිසුම පිළිබඳව පවතින්නාවූ නීතිමය අරගලය ගෙනහැර දක්වනුයේ සත්‍ය වශයෙන්ම පෝක් සමුද්‍ර සන්ධියේ මසුන් ඇල්ලීමේ ගැටළුව රටවල් දෙකටම කෙතරම් කලහකාරී ලෙස බලපා ඇත්ද යන්නයි.

ශ්‍රී ලංකාවේ වයඹ ප්‍රදේශය හා දකුණු ඉන්දියාව ආසන්න වශයෙන් පිහිටා ඇති බැවින් මූලිකවම මන්නාරම, යාපනය හා තමිල්නාඩු දමිළ ධීවරයින් මෙම ගැටළු වලට විසඳුම් ලබා දීමේදී දෙරට අතර පවතින ප්‍රමාදයන්ගෙන් හා අඩුලුහුඩුකම් වලින් පීඩා විදියි. දෙරටේම මෙම තත්ත්වයට මුහුණපාන ධීවරයින් සාමාන්‍යයෙන් ඉතා දුගී ප්‍රදේශ වල වාසය කරන, මසුන් මැරීම සිය එකම ජීවනෝපාය කරගත් අය වෙති. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ යුද්ධයෙන් පසු සිය ජීවිකාවන් නැවත ස්ථාපනය කර ගැනීමට වෙර දරණ ධීවරයින් හට, මසුන් මැරීමෙන් ඔවුන්ට ලාබෙන ආදායම අතිශයින්ම වැදගත් වේ.[16] ඉන්දියාවේ වැඩි වෙමින් පවතින කර්මාන්තකරණයත් සමඟ ධීවරයින් අඩු වශයෙන් වෙනස්කම් වලට ලක්වී ඇත. වෙරළ ඉමේ ඉදි කරනු ලබන කමකට නැති කාර්මික ඉදිකිරීම් වෙරළ ඛාදනයට මඟපාදන අතර, මෙය වෙරළබඩ පවතින ධීවර නිවාස වලට තර්ජනයක් එල්ල කරනු ලබයි. ගල් අඟුරු හා තාප බලාගාර වලින් මුහුදට වේගයෙන් හමන අළු මුදා හරින අතර, ලුණු නිධි ඒවායේ පාංශු ලවණතාව ඉහළ දමමින් වෙරළ ඛාදනය වළක්වනු ලබන කඩොලාන ප්‍රදේශ විනාශයට පත් කරනු ලබයි. මිනිසුන්ගේ අපද්‍රව්‍ය හා නගරයේ කැළි කසල පවා සෘජුවම සාගරයට බැහැර කිරීමෙන්, සාගරයේ සිටින මත්ස්‍යයින් තවදුරටත් ඉන්දියානු සමුද්‍රතීරයෙන් ඉවතට තල්ලු කර දමන අතර, මෙය ධීවරයින්ව ශ්‍රී ලංකා මුහුදු සීමාවෙන් එහාට යාම සඳහා බල කරනු ලබයි.[17] අත් අඩංගුවට ගනු ලැබූවන්ට සලකනු ලබන අන්දම පිළිබඳව මෙහිදී ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ රජයන් දෙකම විශේෂ අවධානයට ගත යුත්තකි. මන්ද දෙපාර්ශවයෙන්ම අත් අඩංගුවට පත් වූවන්ට වන වද හිංසාවන් පිළිබඳව කතා කර ඇති බැවිනි. මෙම ගැටළුව සම්බන්ධයෙන් කඩිනම් විසඳුම් යෙදීම සඳහා දෙරට විසින්ම කටයුතු කළ යුතුය. මන්ද මෙයින් ඇති වන අහිතකර ප්‍රතිඵල වලින් හානි සිදු වනුයේ අන්තර්-රාජ්‍යය සම්බන්ධතාවන්ට පමණක් නොව, විශේෂයෙන්ම දෙරටේම ජනතාවගේ දෛනික ජීවිතය වලටද බලපෑම් සිදු වෙයි.

දෙරටේම මධ්‍යම රජයන් නියෝජනය කරන නිළධාරීන් හා ධීවරයින්ගේ කැමැත්ත නියෝජනය කරනු ලබන නියෝජිතයින්ගෙන් සැඳුම්ලත් ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම විසින් වර්තමානයේ මෙම ගැටළුවට විසඳුම් සෙවීම සඳහා ක්‍රියා කරනු ලබයි. වර්තමාන ක්‍රියාකාරිත්වයේ අරමුණ වී ඇත්තේ, ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ හෝ මුහුදු සීමාව ආසන්නයේ රැඳෙන ඉන්දීය ධීවරයින්ට විරුද්ධව ක්‍රියා කිරීමට යොදවන හමුදා භටයින් ප්‍රමාණය අඩු කිරීම සම්බන්ධයෙන් ගිවිසුමක් ඇති කර ගැනීම, හා ඉන්දීය ධීවරයින් අතින් සිදු වන්නාවූ ධීවර ක්‍රියාකාරකම් සම්බන්ධ උල්ලංඝනය කිරීම් පිළිබඳව ශ්‍රී ලංකාවට කතා කළ හැකි, තමිල්නාඩු රජයටද එකඟ විය හැකි ආකාරයේ අධිකරණ ක්‍රියාමාර්ගයන් අනුකූලනය කිරීම බව දකුණු ඉන්දියාව පවසයි.[18] ආසියානු මානව හිමිකම් කොමිසම විසින් බහුවිධ පැතිකඩයන්ගෙන් සමන්විත පහත පියවරයන් ඇතුළත් කරන ලදීඃ

- දෙරට විසින්ම අදාළ සීමාවන් (මායිම්) සඳහා එකඟ විය යුතුය.
- සියළුම ධීවරයින්ට දිවා හා රාත්‍රී කාල දෙකේදීම දිස්වන පරිදි පිහිටවූ කොඩි හා සූර්ය ශක්තියෙන් ක්‍රියා කරන එළි (පහන්) මඟින් මෙම මායිම් ඇඳු බෝයාවන් සීමාංකනය කිරීම.
- දෙරටේම ධීවරයන්ව ඔවුන්ගේ වගකීම් හා සීමාවන් උල්ලංඝනය කිරීමෙන් අත් වන ප්‍රතිඵල පිළිබඳව දැනුවත් කිරීම. ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ නාවික හමුදාව හා මුහුදු සීමා ආරක්ෂා කිරීමේ ඒජන්සි මඟින් කාර්ය සාධක හමුදාවක් පිහිටවීම හා දෛනික මුර සංචාරයන් පවත්වා ගෙන යාම. දැන් යුද්ධය අවසන් වී ඇති බැවින් ශ්‍රී ලංකා නාවික හමුදාව හට සිය සම්පත් මෙම කාර්යය සඳහා යොමු කිරීමට හැකියාව තිබිය යුතුය.
- සාගර නීතිය උල්ලංඝනය කරනු ලබන ඕනෑම අයෙක් එම අදාළ රටේ පවත්නා නීතියමය ක්‍රියාමාර්ගයන්ට යටත් විය යුතු බවට දෙරට විසින්ම එකඟතාවකට පැමිණිය යුතුය.[19]

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න මහතා පවසනුයේ, "මතක තබා ගන්න මෙය ධීවර ගැටළුවක් පමණක් නොවේ. මෙය රටවල් අතර පවතින සම්බන්ධතාවයන් පිළිබඳවද ප්‍රශ්නයකි. ශ්‍රී ලංකාව හා

[14] http://www.thehindu.com/news/national/tamil-nadu/katchatheevus-sovereignty-has-never-been-with-sri-lanka-karunanidhi/article6214681.ece

[15] http://www.mea.gov.lk/index.php/en/media/statements/1396-the-maritime-boundary-between-sri-lanka-and-india-stands-settled-minister-bogollagama

[16] http://www.aljazeera.com/indepth/features/2014/06/fishing-issue-clouds-india-sri-lanka-ties-2014691244367569.html

[17] http://lens.blogs.nytimes.com/2014/07/16/fishing-in-south-indias-troubled-waters/?_php=true&_type=blogs&_r=0

[18] http://thediplomat.com/2014/03/india-sri-lanka-fishermen-dispute-remains-complicated-despite-modest-advances/

[19] http://www.humanrights.asia/news/ahrc-news/AHRC-ART-130-2013

ඉන්දියාව අතර සම්බන්ධතාවයට දිගු ඉතිහාසයක් පවතී. දීර්ඝ කාලයක් තිස්සේ අපි හොඳ මිතුරන් වෙමු. අපි අපේ ප්‍රශ්න අපි අතර සාකච්ඡා පැවැත්වීම මාර්ගයෙන් විසදාගත යුතුය. මේ සඳහා අපේ රට නිරන්තරයෙන්ම සූදානම්" ලෙසටය.[20] නීතිය හා සමාජ භාරය මෙම ප්‍රවේශය මෙන්ම පවත්නා සාකච්ඡාවන් සමඟ ද එකඟය. එහෙත් මේ සඳහා අදාළ සියළුම පාර්ශ්වයන්ට ඒත් සමගම පෙන්වා දීමට උත්සාහ දරණුයේ මේ ගැටළුව හමුවේ මිනිස් ජීවිත අසරණව පවතිනවා මෙන්ම ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පවත්නා සම්බන්ධතාවයටද බරපතල බලපෑමක් සිඳු විය හැකි බව තේරුම් ගන්නා ලෙසයි. ශ්‍රී ලංකාවේ මෙන්ම ඉන්දියාවේ ද ධීවර පවුල් මෙම පවත්නා තත්ත්වයන් නිසාවෙන් දැඩි පීඩාවන්ට ලක්ව සිටින අතර, මෙම අසරණ ජනතා ඔවුන්ගේ එම පීඩාකාරී තත්ත්වයන්ගෙන් මුදවා ගැනීමට කඩිනම් පියවර ගැනීම දෙරටේම රජයන් සතුව පවතින්නකි.

ගැටුම් තුළ මානව හිමිකම් **(HRiC)** කණ්ඩායම

## උතුරු හා නැගෙනහිර ස්ත්‍රී මූලික කුටුම්බ

යුද්ධය අවසන් වී වසර පහක් ගෙවී ගොස් ඇති තැන බොහෝමයක් දේවල් මේ වන විට ඉෂ්ට වී පැවතියත්, තවමත් උතුරු හා නැගෙනහිර කාන්තාවන් සිය පවුල් පෝෂණය කිරීම සඳහා මහත් වූ පරිශ්‍රමයක් දරමින් සිටියි. ශ්‍රී ලංකා රජය හා එල්. ටී. ටී. ඊ. සංවිධානය අතර පැවති යුද්ධයෙන් බොහෝ කාන්තාවන් වැන්දඹුවන් බවට පත්වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන්ට පවුලේ බර දැරීමට සිදු විය. මෑත කාලීන වාර්තා වල විශේෂයෙන් එල්. එල්. ආර්. සී. වාර්තාවේ සඳහන්ව ඇති පරිදි උතුරු හා නැගෙනහිර යුද්ධයෙන් බලපෑම් ඇති වූ ප්‍රදේශ වල ස්ත්‍රී මූලික පවුල් 40,000 ක් පමණ පවතින අතර මෙම කාන්තාවන් දෛනිකව තම ජීවිතය පවත්වාගෙන යාම සඳහා බෙහෙවින් දුක් විඳියි. යුද්ධය පැවති ප්‍රදේශ වල ජීවත් වන කාන්තාවන්, ඔවුන්ව බහුතර කණ්ඩායම් වලින් වෙන්කොට සැලකීමේ අසාධාරණ තත්ත්වයන්ගෙන් පීඩා විඳිමින් සිටී. උතුරේ පුරුෂයින් හට පක්ෂපාතිත්වයක් දක්වන පීතෘ මූලික සමාජ ආකෘතිය සහ ආර්ථිකයක් හා ප්‍රතිනිර්මාණයක් ඇති කිරීමේ උත්සාහය තව දුරටත් ඔවුන් පීඩාවන්ට ලක් කළ හැකිය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවසනුයේ, "මෙහිදී විශේෂාකාරයෙන් වද වනුයේ උතුරේ ජීවත් වන කාන්තාවන්ගේ ඉහළ යන අනාරක්ෂිතභාවය, ලිංගික අඩත්තේට්ටම් හා අනතුරු වලට ගොදුරු වීම් පිළිබඳවයි. හමුදාව සිටීම කාන්තාවන්ගේ හා ගැහැණු දරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ ගැටළු තවත් සංකීර්ණ කරනු ලබයි. විශේෂයෙන්, පැතිර පවත්නා මුර කිරීම් (පරීක්ෂණ) රටාව හා බැඳුණු මානසික පීඩාවන් කාන්තාවන්ව නිරන්තරයෙන් ලිංගික අතවරයන්, හිංසනයන් හා දූෂණයන් පිළිබඳව පැමිණිලි කිරීමෙන් වළක්වා සිටී."[21] යාපනයේ උතුරේ කාන්තා හා සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධානී සරෝජා සිවචන්ද්‍රන් මහත්මිය පවසනුයේ මෙලෙස පවතින ගෘහස්ථයන් සංඛ්‍යාව 50,000 ද ඉක්මවිය හැකි බවයි. සිවචන්ද්‍රන් මහත්මිය තවදුරටත් ප්‍රකාශ කරන පරිදි ශ්‍රී ලංකාවේ මෙලෙස නැවත සිය ගම් බිම් කරා පැමිණි පවුල් වලට සහාය වීම අඩු කිරීම හා මානුෂීය සංවිධාන තවදුරටත් ක්‍රියාත්මක නොවීම නිසාවෙන් තනි ස්ත්‍රී මූලික පවුල් අස්ථිර ජීවන තත්ත්වයකට මුහුණපා ඇති බවයි. "ආහාර ආරක්ෂණය, පවුල් ආරක්ෂණය, ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ බොහෝ කාරණාවන් සැලකිල්ලට භාජනය කරන අතර එම ලැයිස්තුවට අවසානයක් නොමැති විය හැකිය," යයි සිවචන්ද්‍රන් මහත්මිය පැවසුවාය. එලෙසම අනාවරණය වන්නාවූ කරුණක් වනුයේ තනි බර දරන්නන් වශයෙන්, නිවෙස් වල මූලිකත්වය දරණ කාන්තාවන් නිරන්තරයෙන් රැස්වීම් වලට නොපැමිණෙන බව, මෙන්ම ඔවුන් දවස් කුලී වැඩ කරන්නන් ලෙස වැඩ කරන අතර, තම දරුවන් පිළිබඳව ප්‍රමාණවත් අන්දමේ සැලකිල්ලක් නොදක්වන බවයි. ක්ෂේත්‍ර වාර්තාවෙන් පෙන්වා දෙනුයේ, මෙම පසුබිම තුළ, වැන්දඹුවන්ගේ නව හවුල්කරුවන් හෝ අලුතෙන් පවුලට සම්බන්ධ වු සාමාජිකයින් ළමුන් හට වැරදි සහගත අනිසි බලපෑම් සිදු කරන බවයි.[22] 2013 ජුනි මස එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස්වරයා විසින් පවසනුයේ, යුද්ධයේ අවසාන අදියරේදී අවතැන් වීම් වලට ලක්වූවන්ගෙන් නැවත පැමිණි 467,000 ඇතුළුව කාන්තාවන් සියලු දෙනාගෙන් 40% ක් පමණ පිරිස ඔවුන්ගේ නිවෙස් වල වාසය කිරීමට බියෙන් පසු වන අතර, 25% ක් පමණ දෙනා සිය ගමෙන් පිට වෙළෙඳ කටයුතු කිරීමට පවා බියෙන් පසුවන බවයි.[23] එක් කාන්තාවක් වාර්තා කළේ ඇය ඉඳි කිරීමේ සිට සිවිල් සේවා ආදී විවිධ ක්ෂේත්‍ර වල රැකියා (ලිපිකරු වශයෙන්) සෙවීමට උත්සාහ දැරුවත් ඒවා සාර්ථක නොවූ බවයි. ඇය බලාපොරොත්තු වූ සෑම රැකියාවක්ම පිරිමි අය හට ලැබී ඇත.[24] පවුලක් රැකබලා ගැනීමේ බර පැවතීම, ජීවනෝපායක් සොයා ගැනීම, සහ තමා ආරක්ෂා වීම ඕනෑම වතාවරණයක් තුළ ඉතා අපහසු කර්තව්‍යයක් මෙන්ම විශේෂයෙන් එය පශ්චාත්-යුධ සමාජයක බෙහෙවින්ම අපහසුය. දෙමළ සංස්කෘතිය තුළ දැඩි කැළලක් දරා සිටින වැන්දඹු කාන්තාවන්ගේ මෙම උසුලන්නාවූ පවුල් බර අවට සමාජය විසින් කිසි දිනෙකත් (සාමාන්‍යයෙන්) සැහැල්ලු කරනු නොලබයි. මන්නාරම ප්‍රදේශයේ පූජකවරයෙක් පවසන පරිදි, "දමිළ සමාජය බෙහෙවින් සාම්ප්‍රදායික සමාජයක් වන බැවින් මෙම ස්ත්‍රී මූලික පවුල් වලට බොහෝමයක් අපහසුතාවන් වලට මුහුණ පෑමට සිදු වේ. පිරිමි අයෙක් වැන්දඹු කාන්තාවකගේ පවුලකට උපකාර වීමට ගියහොත් අනිසි සැක සංකාවන් ඇති විය හැකි අතර, සමාජීය හා සදාචාරාත්මක ගැටළු පැන නැඟිය හැකිය. ඔවුන්ට උපකාර වීමට කිසිවෙකුත් නොමැත".[25]

---

[20] http://www.fisheries.gov.lk/news_more.php?nw=82

[21] http://www.cpalanka.org/joint-civil-society-memorandum-to-the-human-rights-council-and-the-international-community/

[22] http://www.irinnews.org/report/98285/bleak-future-for-sri-lanka-s-female-headed-households

[23] http://www.fides.org/en/news/36079-

[24] http://www.ft.lk/2014/05/20/sri-lankan-war-widows-still-struggle-to-support-their-families/

[25] LLRC 202



ශ්‍රී ලංකාවේ දමිළ ජනතාව විශාල වශයෙන් හිංසා පීඩා වලට ලක් වූ බව හා තවමත් සිය එදිනෙදා ජීවිතයේදී පීඩාකාරී තත්ත්වයන්ට මුහුණපාන බව අන්තර්ජාතික ප්‍රජාව සම්පූර්ණයෙන්ම දන්නා කරුණකි. එහෙත් සිය පවුලේ සුභ සිද්ධිය උදෙසා සම්පූර්ණයෙන් වගකියන දමිළ කාන්තාව දිගින් දිගටම තමන් ජීවත් වන සමාජයෙන් පමණක් නොව රටේ පවතින රජයෙන්ද කොන් වී ඇත. මෙම කාන්තාවන්ට උපකාර කිරීම පිණිස ඵලදායී හා ක්‍රියාකාරී ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ඔවුන්ගේ ජාතියේ හා සමාජභාවයේ අභ්‍යන්තරික අංශයන් පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධන කොමිසම් වාර්තාවේ ස්ත්‍රී මූලික කුටුම්බයන්, විශේෂයෙන් එම තත්ත්වයේ සිටින වැන්දඹු ස්ත්‍රීන් මුහුණපාන්නාවූ ගැටළු ගණනාවක් පිළිබඳව වාර්තා කර ඇත. මෙහි ඉඩම් අයිතීන්, වැන්දඹු කාන්තාවන්ව සමාජීයමය වශයෙන් බැහැර කිරීම්, සහ කාන්තාවන් ඉලක්ක කරගත් ආර්ථික සංවර්ධනයේ හිඟකම ආදිය පිළිබඳව විශේෂයෙන් වාර්තා වී ඇත. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පවසන පරිදි, "සංහිඳියාවේ ක්‍රියාමාර්ගයන් ඉදිරියට ගෙන යාම සඳහා ස්ත්‍රී මූලික පවුල් වලට සහාය වීමට පවතින අවශ්‍යතාව ඉස්මතු කර දැක්වීම්ද සමඟ කොමිසමට විවිධ කියාපෑම් අසන්නට ලැබුණි. එම ක්‍රියාවලිය තුළ, මෙම කාන්තාවන්ට ඔවුන්ගේ සහාය පිණිස රජය, සිවිල් සමාජ, හා රටවැසියන් යන සියලුම දෙනා පිටුපසින් සිටින බවද දැන්විය යුතුය."[26]

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව මඟින් වෙන් කොට සැලකීමකින් තොර සමානාත්මතාව පිළිබඳ අයිතිවාසිකම් පිළිබඳව තහවුරු කරන අතර තවදුරටත් මුළුමනින්ම සමානාත්වය තහවුරු කිරීම උදෙසා තරයේ විවිධ ක්‍රියාමාර්ගයන්ද ප්‍රකාශ කරනු ලබයි. කාන්තාවන්ට විරුද්ධ සියලු ආකාරයේ වෙනස්කම් අහෝසි කිරීමේ ප්‍රඥප්තිය (සීඩෝ ප්‍රඥප්තිය) තුළින් කියාපාන්නාවූ අරමුණු වලට ජාතික වශයෙන් අවධානය යොමු කිරීම උදෙසා, එහි එක් පාර්ශ්වයක් මෙන්ම කාන්තාවන්ගේ ගැටළු උදෙසා පැහැදිලි උසස් ප්‍රතිපත්ති සම්පාදන කිරීමට අවශ්‍ය මිනුම් දණ්ඩක් වශයෙන්, 1993 දී ශ්‍රී ලංකාව "කාන්තා ප්‍රඥප්තිය" ක් ඇති කරගත්තේය.[27]

රජය විසින් කාන්තාවන්ට අදාළ විශේෂිත අවශ්‍යතාවන් කෙරෙහි සිය අවධානය යොමු නොකළහොත්, ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් වල පමණක් නොව මුළු රටෙහිම වුවත් සාමය හා සංහිඳියාව ඇති විය නොහැකිය. යුද්ධය හේතුවෙන් වැන්දඹුභාවයට පත් වූ කාන්තාවන් ජීවත් වන ප්‍රදේශ වල දේශපාලනඥයන් මෙන්ම ජාතික නියෝජිතයන් යන දෙපාර්ශ්වයම මෙම කාන්තාවන්ගේ අවශ්‍යතාවන් හදුනාගත යුත්තා සේම ඒ වෙනුවෙන් පෙනී සිටිය යුතුය. රජය විසින් මෙම පශ්චාත් යුධ සමාජය තුළ ඉතා අපහසු බර දරන්නාවූ මෙවැනි කාන්තාවන් හට පිහිට විය හැකි යාන්ත්‍රණයක් සකසා දිය යුතුය. වැන්දඹු කාන්තාවන් හා ස්වාමි පුරුෂයන් අතුරුදහන් වූ කාන්තාවන් හට ඔවුන්ගේ ඉඩම් පහසුවෙන් ලබා ගැනීමට හා ජීවනෝපායක් සරිකර ගනිමින් තමන්ගේ පවුල් වලට උපකාර කිරීමට හැකි පහසු මාර්ගයක් පැවතිය යුතුය. මෙවන් දහස් සංඛ්‍යාත කාන්තාවන් අත්හැර දමා සිටින තාක්කල් ශ්‍රී ලංකාව මුළුමනින් යථා තත්ත්වයට පත් නොවනු ඇත.

නිත්‍යා රාමනාදන්

[26] LLRC Final Report P.182
[27] file:///C:/Users/acer/Documents/intern/Sri_Lankawomen%20un%20report.pdf

## මන්නාරමේ ඉඩම් ගැටලුව

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත් මුළුල්ලෙහි පවතින ඉඩම් පිළිබඳ ප්‍රශ්නය, විශේෂයෙන්ම පශ්චාත්-යුධ පසුබිම තුළ, බෙහෙවින් ගැටලු සහගත තත්ත්වයක් වන අතරතුරෙහි, මන්නාරමේ පැවති රැස්වීමකින්, ජනතාව මුහුණපාන්නාවූ ගැටලු වලට කඩිනම්ව විසඳුම් සැපයීමේ දැඩි අවශ්‍යතාව අවධාරණය කරන ලදී.



නීතිය හා සමාජ භාරය විසින් මන්නාරමේදී ඉඩම් ගැටලුව පිළිබඳ සංවිධානය කරන ලද පොදු සංවාදය අතරතුර, ප්‍රජා සාමාජිකයන් ඉඩම් පිළිබඳ මාතෘකාව සම්බන්ධයෙන් ඔවුන්ගේ කතාවන් සහ අත්දැකීම් බෙදා ගැනීම පිණිස ඉදිරියට පැමිණෙන ලදී. ජාතික අවධානය වැඩි වශයෙන් ඇද ගැනීමට සමත් වූ දෙයකට උදාහරණයක් වශයෙන් විල්පත්තු ජාතික වනෝද්‍යාන ප්‍රසර්පණය හැඳින්විය හැකිය. විල්පත්තු ජාතික වනෝද්‍යාන සීමාවන්හී මුස්ලිම් ජනතාව හට පදිංචි වීමට ඉඩ ලබා දීම පිළිබඳව බොදු බල සේනාව විවේචන පවා එල්ල කර ඇත. මෙම මුස්ලිම් පවුල් 1990 දී එල්.ටී.ටී.ඊ. විසින් මරිච්චුක්කඩ්ඩිහී සිය නිවෙස් අත්හැර යාමට බල කළ ජනතාවයි. ප්‍රාදේශීය ලේකම් පවසන ආකාරයට 1990 දී මුසලි කොට්ඨාශයේ ජනගහනය මුස්ලිම් (84%) දෙමළ (13.4%) සහ සිංහල (2.6%) වශයෙන් පැවතිණ. 1995 දී රජයේ ඉඩම් පවරණ විට 1990 දී ඉවත් කරන ලද මුල් මුස්ලිම් පදිංචිකරුවන් පුත්තලම කඳවුරුද ඇතුළත්ව තාවකාලිකව රටේ විවිධ ප්‍රදේශ වල ජීවත් වූහ. දැන් මරික්කර්තිව් හා මරිච්චුක්කඩ්ඩි වලින් පැමිණි නවාතැන් නොලැබුණු පවුල් 73 ක් විල්පත්තු ජාතික වනෝද්‍යානයට කිලෝමීටරයක් පමණ දුරින් තාවකාලික කූඩාරම් බැඳගෙන සිටී. ඒ මන්දයත් නාවික හමුදාව විසින් මරිච්චුක්කඩ්ඩිහි අක්කර 700 ක පමණ ඉඩම් ආරක්ෂණ හේතූන් සඳහා තමන් වෙත පවරාගෙන ඇති බැවිනි.[28]

මාර්තු මාසයේදී මරිච්චුක්කඩ්ඩිහි අක්කර 50 ක භූමි භාගයක්, දැනට වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්ව පවතින ප්‍රදේශයේ කිලෝමීටර් 1.6 ක් ඇතුළත පදිංචිව සිටින මුස්ලිම් පවුල් වෙනුවෙන් වෙන් කරන ලද බව එක් ප්‍රජා සාමාජිකයෙක් විස්තර කරන ලදී. පසුගිය කාලය තුළ ඔවුන් එහි පදිංචිව සිටී බව පවුල් (වැසියන්) විසින් හිමිකම් ප්‍රකාශ කළත්, ඔවුන්ගේ හිමිකම් පිළිබඳව මෙන්ම ඉඩම් සඳහා පවතින අයිතිය හැඟවීමට ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති ලියවිලි වල සත්‍යතාව තහවුරු කර දැන ගැනීම පිණිස සමීක්ෂණයක් පැවැත්විය යුතුය. වනාන්තර භූමිය 1905 දී අභය භූමියක් බවට ප්‍රකාශයට පත් කිරීමට මත්තෙන් හෝ 1938 දී ජාතික වනෝද්‍යානයක් බවට පත් කිරීමට මත්තෙන් ඇතැම් විට එහි ජනාවාස පවතින්නට ඇත. කෙසේ නමුත්, අභය භූමියක් ලෙසට නියම කළ පසුව එහි කිසිවෙකුටත් පදිංචි වී සිටීමට හෝ නිවාස තැනීමට ඉඩ නොලැබුණි. මෙම ජනතාව නැවත පදිංචි කරවූ නව භූමි භාගය පිහිටා තිබුණේ මෙයට සැතපුම් භාගයක් පමණ දුරිනි. පවුල් විසින් ක්‍රම ක්‍රමයෙන් අල්ලා ගත් ඉඩම් හා නාවික හමුදාව නියුක්තව සිටින ප්‍රදේශය පිහිටා ඇත්තේ එකිනෙකට වෙනස් ස්ථාන දෙකකය. තවත් ප්‍රජා නියෝජිතයෙක් පැවසුවේ නාවික හමුදාවට පහසුකම් සැපයීම සඳහා මෙම ප්‍රදේශයේ මුස්ලිම් පවුල් කිසිම දිනක නැවත පදිංචි නොකරවූ බව සහ එක් දමිළ ගම්මානයක් නැවත පදිංචි කරවා ඇති බවයි.

වර්තමානයේ ජනතාව පදිංචි කරවූ ප්‍රදේශය වන ජීවී සීමාන්තරික කලාපයක් බව වනජීවී දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැවසූ බව එක් ප්‍රජා සාමාජිකයෙක් විසින් ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශීය සභාවට අනුව, විල්පත්තු ප්‍රදේශයේ පවුල් 73 ක් පමණ වාසය කරයි. ඔවුන් දැනට පදිංචිව සිටින ප්‍රදේශයට සමීපයෙන් පිහිටි මරිච්චුක්කඩ්ඩිහි ඔවුන්ව නැවත පදිංචි කරනු ඇත. වැසියන් (ජනතාව) එහි නැවත පදිංචි කරවූ පසු කිසිවෙකුවටත් වාද විවාදයට ලක් කිරීමට කරුණක් එහි නොපවතිනු ඇත. යම්කිසි ඉඩම් හෙක්ටාර ප්‍රමාණයක් සුද්ද කළ බවටද මෙහිදී චෝදනාවක් පැවතිනි. එහෙත් මිනිසුන් සිටියේ අභය භූමිය තුළ නොව සීමාන්තරික කලාපය තුළය.[29]

මෙම විශේෂිත ඉඩම් ආරවුල, ප්‍රදේශයේ (මන්නාරමේ) ජීවත් වන විවිධ වාර්ගික කණ්ඩායම් අතර පවතින සමඟිය මදකම (අසමඟිය), ජනතාව වෙනුවෙන් පවතින නීතිමය යාන්ත්‍රණයන්ගේ අඩුපාඩුකම් සහ මෙම ප්‍රදේශයේ ජීවත් වන ජනතාව හට ඉඩම් කෙතරම් වැදගත් බවක් ගනීද යන්න පිළිබඳව පවතින අපැහැදිලි අවබෝධය ඇතුළුව, මන්නාරමෙහි ජීවත් වන ජනතාව මුහුණ දෙන්නාවූ බහු විධ ගැටලු ඉස්මතු කර දක්වයි.

2013 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මන්නාරමේ දමිළ හා මුස්ලිම් ප්‍රජාවන් අතර පවතින සම්බන්ධතාවයන් පිළිබඳව වාර්තාවක් පිළියෙල කරන ලද අතර, මන්නාරමේ විවිධ ජන වර්ග අතර සමඟිය සහභාවනයට ඉතිහාසයක් පැවතියත්, යුද්ධය නිසාවෙන් මෙම ප්‍රදේශයට ඉතා දරුණු හා අවාසනාවන්ත බලපෑමක් සිදු වූ බව ප්‍රකාශ කරන ලදී. වාර්තාව තුළින් කියාපානුයේ, "ඔවුන් අතර යුද්ධය තීව්‍රභාවයට පත්වූ සැක සංකාවන් හා දැඩි සිත් කැළඹීම්, මෙන්ම

[28]http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=102386

එල්.ටී.ටී.ඊ. ය විසින් 1990 ඔක්තෝම්බර් මාසයේදී උතුරුකරයේ මුස්ලිම් ජනතාව පළවා හැරීමත් සමඟ ඔවුන් අතර පැවති සම්බන්ධතාවයන් ඉරි තලා ගියේය. මුස්ලිම් ජනතාව දිගු කාලීනව අවතැන්ව සිටීම, මන්නාරමෙහි දමිළ ජනතාව සම්බන්ධයෙන් වන අවතැන් වීම හා පදිංචි කරවීම් ඇතුළුව රටෙහි පවතින ක්‍රියාශීලී ස්වාභාවය, සහ සිවිල් පරිපාලනයේ පැවති අභියෝගයන් යනාදිය අරවුල් තවත් ඇති කර අවුල් සහගත තත්ත්වයට පත් කරනු ලබයි.”[30] ජනතාව ඔවුන් දූන් භුක්ති විඳින සෘණාත්මක ඉතිහාසය නිසාවෙන් මෙම ගැටලුවට මැදිහත් වීමට හෝ සමඟියෙන් බේරුම් කරගැනීමට පසුබට වෙයි.

ඉඩම් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පවතින සීමිත යාන්ත්‍රණයන් (ඉඩකඩ) නිසාවෙන් ප්‍රජාව අතර දැඩි කැළඹීමක් ගොඩ නැගෙමින් පවතී. මන්නාරමේ ඉඩම් පිළිබඳ බලය සම්පූර්ණයෙන්ම දේශපානඥයන්ගේ අතේ පවතින බව ප්‍රජා සාමාජිකයෙකු විසින් සඳහන් කරන ලදී. නිළධාරින් හට දේශපාලනඥයන්ට විරුද්ධව කිසිදු පියවරක් ගත නොහැකි බව ඔහු විසින් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මිනිසුන් විසින් මුහුණපාන්නාවූ මෙම ඉඩම් ගැටලුවට පහසුවෙන් ලබා ගත හැකි විසඳුම් මෙන්ම ඔවුන් තුළ මෙම ගැටලුව සම්බන්ධයෙන් පවතින්නාවූ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා සුදුසු වාතාවරණයක් (ඉඩකඩක්/ වේදිකාවක්) සලසා නොදුනහොත් ජනතාවගේ සිත් තුළ පවතින්නාවූ උද්වේගකාරීබව (අවිනිශ්චිතභාවයන්) තව තවත් උත්සන්න විය හැකිය. මන්නාරමේ ජීවත් වන ජනතාව මෙන්ම රටේ අනෙකුත් ප්‍රදේශ වල ජීවත් වන ජනතාවටද තම ඉඩම් පිළිබඳව දැඩි හැඟීමක් පවතී. මන්ද එය ඔවුන්ගේ ඉතිහාසය, ඔවුන්ගේ අනන්‍යතාව සහ ඔවුන්ගේ අතීතයට හා පවුල් වලට බැඳී පවතින බැවිනි. විශේෂයෙන් උතුරු නැගෙනහිර පළාත් වල ජනතාවට මෙම තත්ත්වය දැඩිව බලපායි. මන්දයත් ඔවුන්ගෙන් විශාල ප්‍රමාණයක් අවතැන් වූවන් වන බැවින් හා ඉඩම් කෙරෙහි ඔවුන්ගේ පවතින හැඟීම අතිමහත්ය.

ශ්‍රී ලංකා රජය උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම සහ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම තුළින් මෙවන විටත් නැවත පදිංචි කිරීම් හා ඉඩම් අහිමි වීම් වලට සාර්ථකව පිළිතුරු සැපයිය හැකි ක්‍රමවේදයන් සලසා දී තිබේ. කැබිනට් පත්‍ර 13/2011 තුළින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නව වැඩසටහන විශේෂයෙන් ඉදිරියට ගෙනෙන ලදී. මෙම වැඩ සටහනෙන් ඉඩම් ගැටලුවට විසඳුම් ලබා දීම පිණිස උපරිබරිත (අධික බර පටවන ලද) විධිමත් අධිකරණ ක්‍රමයක් වෙනුවට ප්‍රජා මූලිකයන් යොදා ගැනීම ඇතුළුව අර්ධ වශයෙන් විධිමත් ක්‍රමවේදයන් යොදා ගන්නා ලදී. කොමිසම විසින් ඉහත වැඩ සටහනට සහය දක්වූවත්, අදාළ පුද්ගලයින් හට අවශ්‍ය නීතිමය ඔප්පු කිරීම් (සාධක) පවතී නම්, ඔවුන් තම නඩුව (පැමිණිල්ල) අධිකරණයක් මාර්ගයෙන් ඉදිරියට ගෙන යා යුතු බව අවධාරණය කරනු ලබයි. ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළින් පවා සාධාරණය ඉටු කර ගැනීමට නීතියේ පිහිට පැතීම අවශ්‍ය බව අවධාරණය කරනු ලබයි. රජය විසින් නීතිමය උපකාරය අවශ්‍ය සියලුම අභ්‍යන්තරික අවතැන් වූවන් හට එම අවශ්‍ය නීතිමය ලියකියවිලි හා ආධාරයන්ට ප්‍රවේශ වීමට ප්‍රමාණවත් පහසුකම් සපයා දිය යුතු බව ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළින් නිර්දේශ කරනු ලබයි. ජාතික නිරුත්සාහක නැවත පදිංචිකිරීමේ ප්‍රතිපත්තියට (NIRP) අනුව විධිමත් ආකාරයෙන් ඉඩම් අයිතිවාසිකම් ප්‍රකාශ කළ නොහැකි ඇතැම් බලපෑමට ලක්වූ පුද්ගලයන්ව සහනාධාර ලබා දීම සඳහා ඉදිරිපත් නොකළ යුතුය. එහෙත් විධිමත් ඔප්පු නොමැති වීම නැවත පදිංචි කරවීමේ ක්‍රියාවලියට විශාල අවහිරයක් බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම සඳහන් කළත්, ජාතික නිරුත්සාහක නැවත පදිංචිකිරීමේ ප්‍රතිපත්තියට එය බාධාවක් ලෙස නොපෙනේ. රජය විසින් වෙන් කිරීමේදී (ඉඩම්), නැවත පදිංචි කිරීමේදී හා ඉඩම් පිළිබඳ ගැටලු සමථයකට පත් කිරීමේදී තම රාජකාරිය මුළුමනින්ම ඉෂ්ට කරන බව සහතික කළ යුතු සේම, ජනතාවට උපකාර වීම පිණිස පිහිටුවා ඇති යාන්ත්‍රණයන් (ක්‍රමවේදයන්) ට ඔවුන්ට ප්‍රවේශ විය හැකි බවද සනාථ කළ යුතුය.

ගැටුම් තුළ මානව හිමිකම් **(HRiC)** කණ්ඩායම

[29] http://www.sundayobserver.lk/2014/04/27/fea06.asp

[30] Tamil-Muslim Tensions and Coexistence in Mannar: Land Disputes in Sannar and Uppukulam. Centre for Policy Alternatives. 2013


***Published by Law & Society Trust***

*Send your stories, photos and cartoons to*
*lst.hricprogramme@gmail.com*

*Published in English & Sinhala and downloadable from*
*http://www.lawandsocietytrust.org/resources.html*